අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/27/15/03/2025(iii)

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2026.03.17

**සියලුම ජාතික පාසල් විදුහල්පතිවරුන් වෙත.**

**2025 වාර්ෂික/අනිවාර්ය ජාතික පාසල් ගුරු ස්ථාන මාරු සම්බන්ධ නියෝග දැනුම් දීම හා අභියාචනා කැඳවීම**

2025 වාර්ෂික/අනිවාර්ය ගුරු ස්ථාන මාරු සම්බන්ධයෙන් පහත විෂයන්ට ( සියලු මාධ්‍ය) අදාළ ස්ථාන මාරු නියෝග ගුරුවරුන්ට **2026.03.17** දින සිට මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ප්‍රදර්ශනය කිරීමට නියමිත ය. ඒ පිළිබඳ ඔබ පාසලේ ගුරුවරුන් දැනුවත් කරන ලෙස මෙයින් දන්වමි.

01. බුද්ධ ධර්මය
02.බෞද්ධ ශිෂ්ටාචාරය
03. බුද්ධ ධර්මය ( උ.පෙළ)
04. කතෝලික ධර්මය
05. ක්‍රිස්තියානි ධර්මය
06. ඉස්ලාම් ධර්මය ( සා.පෙළ)
07. ඉස්ලාම් ධර්මය ( උ.පෙළ)
08. ඉස්ලාම් ශිෂ්ටාචාරය
09. ශෛවනෙරි
10. හින්දු ධර්මය ( උ.පෙළ)
11. හින්දු ශිෂ්ටාචාරය
12. ක්‍රිස්තු ධර්මය ( උ.පෙළ)
13. සාහිත්‍යය හා රසාස්වාදය (ඉංග්‍රීසි)
14. සාහිත්‍යය හා රසාස්වාදය (සිංහල)
15. සාහිත්‍යය හා රසාස්වාදය (අරාබි)
15. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ( සා.පෙළ)
16. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ( උ.පෙළ)
17. නිර්මාණකරනය , විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය
18. නිර්මාණකරනය හා තාක්ෂණවේදය
19. නිර්මාණකරනය හා ඉදිකිරීම් තාක්ෂණවේදය
20. නිර්මාණකරනය හා යාන්ත්‍රික තාක්ෂණවේදය
21. ගෘහ විද්‍යාව
22. ගෘහ ආර්ථික විද්‍යාව
23. දේශපාලන විද්‍යාව
24. සිංහල ( උ.පෙළ)
25. දෙමළ ( උ.පෙළ)
26. භූගෝල විද්‍යාව ( උ.පෙළ)
27. ප්‍රායෝගික තාක්ෂණික කුසලතා
28. විශේෂ අධ්‍යාපනය
29. ව්‍යවසායකත්ව අධ්‍යයනය
30. ඉතිහාසය (උ.පෙළ)
31. ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය

teachmore.lk

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

02. මීට ඉහත නිකුත් කළ හෝ දීර්ඝ කරන ලද ස්ථාන මාරු නියෝගයක් පවතින එයට අනුව මේ වන තෙක් ක්‍රියා නොකළ ගුරුවරයෙකුට නැවත 2025 වාර්ෂික/ අනිවාර්ය ස්ථාන මාරු නියෝග මඟින් වෙනත් ස්ථාන මාරු නියෝගයක් ලබා දී ඇත්නම් එහි දී පෙර ස්ථාන මාරු නියෝගය බල රහිත වන බව සැලකිය යුතු ය.

03. ජාතික පාසල් ගුරුවරුන්ට තම ස්ථාන මාරු නියෝග nstt.moe.gov.lk දිගුව ඔස්සේ Login as a teacher මඟින් මාර්ගගත ව නිරීක්ෂණය කළ හැකි ය.

04 මෙම තීරණ සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන ගුරුභවතුන්ට වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව වෙත මාර්ගගත ක්‍රමවේදයට අභියාචනා ඉදිරිපත් කළ හැකි ය. අභියාචනා ඉදිරිපත් කරන ගුරුභවතුන් **2026.03.17** දින සිට **2026.03.31** දින දක්වා nstt.moe.gov.lk දිගුව ඔස්සේ Login as a teacher මඟින් පිවිස අභියාචනා සම්පූර්ණ කර එහි මුද්‍රිත පිටපත සමඟ අභියාචනයට අදාළ ඇමුණුම් ද සහිත ව **2026.04.01** දින හෝ එදිනට පෙර වැටුප් ලබන පාසලේ විදුහල්පතිවරයා වෙත භාර දීමට කටයුතු කළ යුතු ය. මේ පිළිබඳ ව සියලු ගුරුවරුන් දැනුවත් කිරීම ජාතික පාසල් විදුහල්පතිවරුන්ගේ වගකීම වේ.

05.ගුරුවරුන් විසින් මාර්ගගත ව ඉදිරිපත් කරන අභියාචනා සඳහා විදුහල්පති නිර්දේශ nstt.moe.gov.lk දිගුව ඔස්සේ Login as a principal මඟින් පිවිස මාර්ගගත ව **2026.04.01** දිනට පෙර ඇතුළත් කර එහි මුද්‍රිත පිටපත ගුරුවරයා භාර දුන් අයදුම්පතට අමුණා TTB/APPEAL LIST උපලේඛනය සමඟ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු ස්ථාන මාරු ශාඛාව වෙත **2026.04.06** දිනට පෙර විදුහල්පති හෝ නියෝජ්‍ය විදුහල්පතිවරයකු විසින් පැමිණ භාර දිය යුතු ය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතු ය.

06. වැඩිදුර උපදෙස් හෝ යම් ගැටලුවක් පවතී නම්, රාජකාරී කාලය තුළ පහත දුරකථන අංකවලට අමතන්න.

teachmore.lk

| | |
|---|---|
| මාර්ගගත ක්‍රමය ඔස්සේ අභියාචනා අයදුම් කිරීමේදී තාක්ෂණික ගැටලුවක් පවතී නම් දත්ත කළමනාකරණ ශාඛාව ඇමතීමට | 011-2075854 |
| ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ශාඛාව ඇමතීමට | 011-2784837 |

**ඒ.ජේ.එස්.එස්. එදිරිසූරිය**
අතිරේක ලේකම් (ගුරු ආයතන)

**අත්.කළේ: ලේකම්**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය
අධ්‍යාපන අමාත්‍යාංශය